**ශීර්ෂය 104 - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 104 - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2017 ජූනි 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 33,219.05 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 22,794.22 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10,424.83 ක් හෙවත් සියයට 31.38 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 2,025.44 | 1,938.03 | 87.41 | 4.32 |
| මූලධන | 31,193.61 | 20,856.19 | 10,337.42 | 33.14 |
| **එකතුව** | **33,219.05** | **22,794.22** | **10,424.83** | **31.38** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 10401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 28.00 | 27.74 | 6.00 | 12.98 | 70.00 | 52.12 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ පහත සඳහන් තැන්පත් ගිනුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 15.66 ක් විය. විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0002/0144/000 | 0.09 |
| 6000/0000/00/0013/0099/000 | 13.64 |
| 6000/0000/00/0016/0090/000 | 1.93 |
| **එකතුව** | **15.66** |

## 2.4 විගණන නිරීක්ෂණය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශන

------------------------------------------------------------------

විෂය අංක 10401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,848,522 ක් වී තිබුණි. එම ණය ශේෂයයන් වර්ෂ 01 ක සිට වර්ෂ 16 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ණය ශේෂ අමාත්‍යාංශය විසින් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය.

--------------------------

අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2016 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය භාරයේ වාහන 86 ක් පැවැති අතර ඉන් වාහන 84 කට අදාළ වාහන ලියාපදිංචි කිරීමේ සහතික අනුව එම වාහනවල අයිතිය අමාත්‍යාංශය නමින් නොතිබුණි. තවද, අමාත්‍යාංශය යටතේ ඇති ලෝක ආහාර වැඩසටහනට අනුයුක්ත කර තිබූ වාහන සංඛ්‍යාව 107 කින් වාහන 105 කට හා ජාතික නායකත්ව හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාහන 10 කට අදාළව වාහන ලියාපදිංචි කිරීමේ සහතික අනුව එම වාහනවල අයිතිය එම ඒකක නමින් හෝ මෙම අමාත්‍යාංශය නමින් හෝ නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට හා 2016 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මටද ඇතුළත් නොවූ, ප්‍රථම සංවත්සර සැමරුම හා "ණය බරින් මිදීම" තේමාව යටතේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය දැන්වීම් පළකිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 12,853,800 ක් හා රු. 26,862,775 ක් 2016 වර්ෂයේදී වැය කර තිබුණි. තවද, එම කාර්යයන් අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්ට අයත් ක්‍රියාකාරකම් නොවන බවද නිරීක්ෂණය විය.

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------

සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට ටැබ් පරිගණක යන්ත්‍ර 100 ක් මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 10 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර 2016 නොවැම්බර් 28 එම මුළු මුදලම සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත ගෙවා තිබුණි. නමුත් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මිලදී ගැනීම සිදු කර නොතිබුණි.

### 3.5 මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම.

----------------------------------

ගොල්ඩන් කී ණය කාඩ්පත් සමාගමේ වත්කම් ඇවරකිරීමෙන් පසු මහා භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවීමේ පදනම මත 2016 නොවැම්බර් 03 දින පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 500 ක අතිරේක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. 2016 නොවැම්බර් 30 දින රු.මිලියන 300 ක් හා 2016 දෙසැම්බර් 16 දින රු.මිලියන 200 ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවා තිබුණි. මෙම ගෙවීම මගින් ගොල්ඩන් කී ණය කාඩ්පත් සමාගම හා ඊට අනුබද්ධිත සමාගම්වල වත්කම් ඇවරකිරීම සඳහා නීති

ප්‍රකාරව කඩිනමින් පියවර ගැනීම සහ එම සමාගමෙහි වත්කම් ඇවරකිරීමෙන් ලැබෙන ආදායම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවීමේ කොන්දේසිය පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් එම ගෙවීම් කිරිමට අනුමැතිය ලබා දී තිබුණි. 2015 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා ගොල්ඩන් කී ණය කාඩ්පත් සමාගමේ සුරක්ෂිත තැන්පතු හිමියන්ගේ තැන්පතු ආපසු ගෙවීමට රු.මිලියන 4,989.9 ක් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී තිබුණි. අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් පරිදි වත්කම් ඇවරකිරීම සඳහා නිති ප්‍රකාරව කඩිනමින් පියවර ගැනීම සිදුකළ යුතු වුවත්, 2017 ජුනි 12 දින වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

3.6 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 79 | 62 | 17 |
| (ii) | තෘතීක මට්ටම | 154 | 92 | 62 |
| (iii) | ද්විතීයික මට්ටම | 241 | 237 | 4 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 133 | 113 | 20 |
| (v) | වෙනත් | 4 | 1 | 3 |
| | **එකතුව** | **611** | **505** | **106** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2015 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රතිපත්ති සම්පාදනය, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පුද්ගලයෙකුට තාවකාලික රියදුරු පත්වීමක් ලබා දි තිබුණි. 2015 සැප්තැම්බර් මාසයේ සිට එම සේවකයා විදේශ කටයුතු අමාත්‍යාංශයේ රියදුරෙකු වශයෙක් කටයුතු කර තිබුණි. නමුත් එදින සිට 2016 අගෝස්තු මාසය දක්වා අමාත්‍යාංශය විසින් එම තාවකාලික රියදුරුට වැටුප් හා දීමනා වශයෙන් රු.337,625 ක් ගෙවා තිබුණි